# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය, කොළඹ

## පුවත්පත් නිවේදනය

ඉන්දියාවේ හිටපු අග්‍රාමාත්‍යවරයෙකු වන අතල් බිහාරි වජ්පායි මහතා 2018 අගෝස්තු 16 වන දින නව දිල්ලි නුවරදී අභාවප්‍රාප්ත වූ බව ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය මහත් සංවේගයෙන් දන්වා සිටියි.

2018 අගෝස්තු 17 වන දින නව දිල්ලියේ ස්මිරති ස්තල් හිදී අවමඟුල් රාජ්‍ය උත්සවය පැවැත්වෙනු ලැබේ. අභාවයට පත් එතුමන්ට උපහාරය පළ කිරිම සඳහා 2018 අගෝස්තු 16 සිට 22 වන දින දක්වා දින හතක ජාතික ශෝක කාලයක් ප්‍රකාශයට පත් කර ඇත.

2018 අගෝස්තු 21 සහ 22 දෙදින පෙ.ව. 10.00 සිට ප.ව. 5.00 දක්වා නො. 36 – 38, ගාලු පාර, කොළඹ 03 හි පිහිටි ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේදී ශෝකය පළ කිරීමේ සටහන් පොතක් විවෘතව තැබෙනු ඇත.

අතල් බිහාරි වජ්පායි මැතිතුමා 1996, 1998 සිට 1999 දක්වා සහ 1999 සිට 2004 දක්වා ඉන්දියාවේ අග්‍රාමාත්‍ය ධූරය හෙබවීය. එසේම ඔහු 1977 සිට 1979 දක්වා ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍යවරයා ලෙස කටයුතු කළේය. එතුමා කීර්තිමත් දේශපාලනඥයකු, ශ්‍රේෂ්ඨ කථිකයකු සහ කවියෙකු වේ. දස වන සාර්ක් සමුළුවට සහභාගී වීම සඳහා එතුමා 1998 වසරේ ජූලි මාසයේදී කොළඹට පැමිණියේය.

කොළඹ

2018 අගෝස්තු 17